# ***යෙසායා 62 ඉශ්‍රායෙලය වෙනුවෙන් දින 21 ගෝලීය නිරාහාර යාච්ඤාව*** *(මැයි 7-28, 2023)*

යෙරුසලම සහ ඉශ්‍රායෙලය වෙනුවෙන් දෙවියන් වහන්සේගේ ගැළවීමේ පොරොන්දු සහ සැලසුම් වැඩි කිරීම සඳහා, *දින 21ක්, අවම වශයෙන් දිනකට පැය 1ක් වත්* (මැයි 7-28) ඉශ්‍රායෙලය වෙනුවෙන් යාච්ඤාවේ යෙදෙන මිලියන 1 කට අධික ඇදහිලිවන්ත පිරිස සමග එක්වන්න. සමහර අය තනිව යාච්ඤා කරන අතර තවත් සමහර අය, අවංකව හා පෞද්ගලිකව - ඔවුන්ගේ නිවසේ, කාර්යාලයේ, නේවාසිකාගාරයේ හෝ ඔවුන්ගේ සභාවේ යනාදී වශයෙන්, 2ක් හෝ ඊට වැඩි පිරිසක් සමග එකතුවී යාච්ඤා කරනවා ඇත (ශු. මතෙව් 18:20).

ලෝ ඒන්ජල්, ජේසන් හබාර්ඩ්, මයික් බික්ල් ඇතුළුව - සේවාවන් දහස් ගණනක සහයෝගීතාවයක් සමග - විවිධ ආකාරවලින් නිරාහාරව සිටීමට සහ ඉශ්‍රායෙලය සඳහා දෙවියන්වහන්සේගේ අරමුණු වෙනුවෙන් යාච්ඤා කිරීමට හා යෙසායා 62:6 හි සඳහන් පරිදි එතුමාගේ පොරොන්දුවට අනුව ඉශ්‍රායෙලය වෙනුවෙන් මැදිහත්කරුවන් මිලියන 100ක් නැගිටුවන ලෙස එතුමාගෙන් ඉල්ලා සිටීමට හා ස්වාමින් වහන්සේට එතුමාගේ පොරොන්දු මතක් කර දෙන මැදිහත්කරුවන් ස්වෛරී ලෙස "පත් කිරීමට", "නියම කිරීමට" හෝ "සලකුණු කිරීමට" ***<u>ගෝලීය විධිමත් සමුළුවකට</u>*** (මැයි 7-28) සහභාගී වීමට මිලියන *1ක් ඇදහිලිවන්තයන්* බලමුලු ගන්වා ඇත.

***6 එම්බා ජෙරුසලම! නුඹේ පවුරු පිට <u>මම මුරකරුවන් සිටෙව්වෙමි.</u> ඔව්හු <u>රෑ වත්, දාවල් වත්</u> කිසිසේත් නිශ්ශබ්ද නොවන්නෝය. සමිඳුන් අයැදින <u>ඔබ</u>*** *(මැදිහත්කරුවන්)* ***විවේක නොගන්න.***

***7 එතුමන් ජෙරුසලම ප්‍රතිසංස්කරණය කොට එය මුළු ලොවෙහි*** *(යේසුස්වහන්සේගේ නැවත පැමිණීමේදී)* ***වර්ණනාවට ලක් වන නගරයක් වන <u>තුරු</u> ඔව්හු එතුමන්ට විවේකයක් නොදෙති. (යෙසායා 62:6-7)***
මාර්තු 7 වන දින මෙම නිරාහාරය නිවේදනය කර පළමු සති 3 තුළ *මිලියනයකට* අධික පිරිසක් විවිධ ආකාරයෙන් මෙයට සහභාගී වීමට නියමිතව ඇත. මැයි 7 වන විට, *මිලියනයකට* වඩා වැඩි පිරිසක් මෙම දින 21-නිරාහාර යාච්ඤාවේ විවිධ ආකාරවලින්, (සමහරු වතුර පමණක් පානය කර, සමහරු එළවළු, හෝ යුෂ පානය කිරීමෙන්, හෝ දිනකට එක් ආහාර වේලක් ගැනීමෙන් හෝ හුදෙක් "නිරාහාර මාධ්‍යය" තුළ) යාච්ඤාවේ යෙදෙනු ඇති අතර, එය උන්වහන්සේගේ මහිමය මුදා හැරීම සඳහා වන්නේය (නික්. 33:18).

***IHOPKC*** යාච්ඤා කුටිය ඉශ්‍රායෙලය සඳහා සති 3ක් (මැයි 7-28) 24/7 නොකඩවා නමස්කාර කිරීමට සහ යාච්ඤා කිරීමට කැපවී සිටී. IHOPKC හි පූර්ණ කාලීන සේවා කාර්ය මණ්ඩලයේ 300 කට අධික සංඛ්‍යාවක් ***දින 21 පුරාම දිනකට පැය 6-12 අතර කාලයක්*** අපගේ යාච්ඤා කුටියේ සිටීමට පුද්ගලිකව කැපවී සිටිති. මෙය සිදු කිරීම සඳහා ඔවුන්ගේ සාමාන්‍ය වගකීම් බොහොමයක් පසෙකට දැමීමෙහි ලා ඔවුන්ගේ ප්‍රතිචාරය ගැන මම කෘතඥ වෙමි! IHOPKC යාච්ඤා කුටිය මෙයට සම්බන්ධ ***බොහෝ මාධ්‍ය*** වලින් එකක් පමණි. ඔබේ සභාව හෝ දේවසේවය කේන්ද්‍රස්ථානයක් වන්නේ කෙසේද යන්න පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා ***<u>Isaiah62Fast.com</u>*** හෝ ***Isaiah 62 Fast Facebook පිටුව*** (<u>https://rb.gy/8orcjp</u>) බලන්න.

***<u>Isaiah62Fast.com</u>*** වෙබ් අඩවිය දින 21 (මැයි 7-28) සඳහා අන්අය බලමුලු ගැන්වීමේදී සේවා සම්පත්, නිතර සන්නිවේදනය ආදිය සපයන අතර, "මාධ්‍යයක්" වීමට කැමති සභාවන්, සේවාවන්, බයිබල් අධ්‍යයන, තරුණ කණ්ඩායම් ආදිය හඳුනා ගනී. ඔබට ඔබගේ සභාවේ හෝ දේවසේවයේ තොරතුරු ***<u>Isaiah62Fast.com</u>*** හි ලැයිස්තුගත කිරීමට අවශ්‍ය නම්, ඒ සඳහා වැඩිදුර තොරතුරු දැනගැනීමට සබැඳිය ක්ලික් කරන්න.

***<u>Isaiah62Fast.com</u>*** කිසිදු ***අවසන් තත්වයක*** සිටිනන්නවුන් අමතන්නේ නැති අතර, සියලූම තත්වයන් වල සිටින ඇදහිලිවන්තයන් මීට සහභාගී වන ලෙස කැඳවයි.

### ***මිලියන 100ක් මන්ද?***
වසර ගණනාවක් පුරා, සමිඳාණන් වහන්සේ විවිධ පුද්ගලයින්ට විවිධ ආකාරවලින් ඉශ්‍රායෙලය සඳහා ***මැදිහත්කරුවන් මිලියන 100 ක්*** ගණනින් ලබා දී ඇත. එරික් වොට්, ජේසන් හබාර්ඩ් (IPC) සහ කණ්ඩායම මෑත වසරවලදී IHOPKC වෙත කිහිප වතාවක්ම පැමිණ ඇත. ඔවුන් ***සාමූහිකව මිලියන 130 ඇදහිලිවන්තයන් ඇතුළත් 5,000 + ක යාච්ඤා ජාලයන්*** අධීක්ෂණය කරන නායකයින් සමග නිරන්තරයෙන් සන්නිවේදනය කරන අතර ඔවුන්ව නියෝජනය කරයි (මුලින් මට එම සංඛ්‍යා විශ්වාස කිරීමට අපහසු විය). ඔවුන්ගේ මෑත සංචාරයේදී (දෙසැ. 2022) මෙම යාච්ඤා ජාලයන් 5,000_ හි නායකයින් සහ ඒවාට සම්බන්ධ මිලියන 130 ක මැදිහත්කරුවන් එක්ව ***2023 දී 4 වතාවක්*** *ලෝකයේ එකම ප්‍රදේශය සඳහා යාච්ඤා කිරීමට එක්ව සිටින* බව ඔවුන් බෙදා ගත්හ. ***<u>110cities.com</u>***. මිලියන 100කට අධික ඇදහිලිවන්තයන් එකම දිනක එකම භූගෝලීය ප්‍රදේශයක් සඳහා එක් වසරක් තුළ 4 වතාවක් එකට යාච්ඤා කරන ඉතිහාසයේ පළමු අවස්ථාව මෙය බව සලකන බැවින් මම අතිශයින් සතුටට පත් වෙමි (බලන්න ශු. යොහන් 17:21-23).

මෙම මිලියන 100 ***චීනය*** වෙනුවෙන් 2023, ජනවාරි මස 22 යාච්ඤා කළෝය. ඔවුන් ***මැදපෙරදිග රටවල්*** වෙනුවෙන් අප්‍රේල් මස 17 වන දින යාච්ඤා කරන අතර, ***මැයි මස 28 වන දින ඉශ්‍රායෙලය*** වෙනුවෙන්ද, ***ඉන්දියාව*** වෙනුවෙන් ඔක්තෝබර් මස 31 වන දින යාච්ඤා කරනවා ඇත. මෙම ඇදහිලිවතුන් මිලියන 100 යේසුස්වහන්සේට හා මහත් ආඥාවට ඉතා ගැඹුරින් කැප වූ අතර, ඔවුන්ගෙන් බොහෝ *දෙනා තවමත් ඉශ්‍රායෙලය සඳහා වන ස්වාමින්වහන්සේගේ වචනයේ සඳහන් අරමුණු වලට සම්බන්ධ නොවී සිටින්නෝය.* නමුත් එක් දිනක් (මැයි මස 28) මෙම මිලියන 100 දෙනා ජනවාරි මස 22 වන දින චීනයට

යාච්ඤා කළාක් මෙන්, ඉශ්‍රායෙලය වෙනුවෙන්ද යාච්ඤා කරන්නෝය. නමුත් මැයි 28 වන දින දක්වා දින 21ක් පවත්වන යාච්ඤාවේදී, *මිලියන 1+* මැදහත්කරුවන් යාච්ඤා කරමින්, ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් පුදුමාකාර ආක්‍රමණයක් කරන ලෙස" ඔවුන් ඉල්ලන අතර, ඉශ්‍රායෙලය වෙනුවෙන් එතුමාගේ අරමුණ මෙම මිලියන 100 දෙනාගේ ජීවිතයේ සනිටුහන් කරන ලෙසට යාච්ඤා කරන්නෝය.

***සාරාංශය*** : මැයි 28 වන දින, ඉශ්‍රායෙලය වෙනුවෙන් අවම වශයෙන් පැයක්වත් යාච්ඤා කිරීමට සෑම දිනකම තනිව හෝ 2ක් හෝ ඊට වැඩි ගණනක් සමඟ (ශු. මතෙව් 18:20) අවංකව හෝ පෞද්ගලිකව ඉශ්‍රායෙලය වෙනුවෙන් යාච්ඤාවේ යෙදෙන මිලියන 1කට අධික සංඛ්‍යාවක් සමඟ එකතු වී මිලියන 100ක් සලකුණු කිරීමට ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න.

**ඉශ්‍රායෙලය හා යෙරුසලම වෙනුවෙන් යාච්ඤා කිරීම අප අධික ලෙස අගය කොට සලකන්නේ ඇයි?**

ඉශ්‍රායෙලයේ ජාතික පසුතැවිල්ල (ක්‍රියා 3:19) සහ යේසුස්වහන්සේ මෙසියස්වහන්සේ බව ප්‍රකාශ කිරීම (ශු. මතෙව් 23:39) යේසුස්වහන්සේගේ දෙවන පැමිණීමට, මහා ආඥාවට සහ මුළු ලෝකයේම "මරණයෙන් ජීවනයට පැමිණීම" (රෝම 11:15) සමඟ ගැඹුරින් සම්බන්ධ වේ. ගීතාවලිය 118:26 ට අනුව යෙරුසලමේ නායකයන් එතුමාව මෙසියස්වහන්සේ ලෙස පිළිගන්නා තුරු යේසුස්වහන්සේ නැවත පැමිණෙන්නේ නැත.

***"අහෝ ජෙරුසලම!.... "සමිඳාණන් වහන්සේගේ නාමයෙන් වඩින තැනැත්තා*** *(යේසුස්වහන්සේ)* ***හට ආසිරි වේ වා"යි <u>නුඹ පවසන</u> කාලය එන තුරු මෙතැන් සිට <u>නුඹ මා</u>*** *(මෙසියස්වහන්සේ බව පිළිගන්න - ගීතාවලිය 118:26)* ***<u>තවත් නොදකින්නීය</u>*** *(යේසුස්වහන්සේගේ ඊම පිළිබඳ සඳහන් කිරීමක්).* ***(ශු. මතෙව් 23:37-39)***

***එබැවින්, ඔබේ*** *(ඉශ්‍රායෙලය)* ***පව් මකාලන පිණිස ද දෙවියන් වහන්සේ කෙරෙන් නව ජීවන යුගයක් පැමිණෙන පිණිස ද ඔබ උදෙසා පෙර නියම කරන ලද ක්‍රිස්තුන් නම් ජේසුස් වහන්සේ එවා වදාරන පිණිස ද <u>පසුතැවී සිත් හරවා ගෙන</u> දෙවියන් වහන්සේ වෙතට හැරෙන්න. ආදි යුගවල සිට දෙවියන් වහන්සේ ස්වකීය ශුද්ධ දිවැසිවරයන්ගේ මුවින් දැන්වූ, <u>මුළු ලොවට නව ජීවනය දීමේ</u> කාලය පැමිණෙන තුරු උන් වහන්සේ <u>ස්වර්ගයේ වැඩ විසිය යුතු ය.</u>*** *(පියාණන්වහන්සේගේ දකුණු පස වැඩහිඳීම හෝ අල්ලාගෙන සිටීම)* ***(ක්‍රියා 3:19-21)***

පාවුල් තුමා ඉගැන්වූයේ අවසාන කාලයේදී යේසුස්වහන්සේව වැළඳගැනීම සඳහා ඉශ්‍රායෙල් ජාතිය පෙළඹීමට දෙවියන්වහන්සේ අන්‍යජාතික ඇදහිලිවන්තයන් පාවිච්චි කරන බවයි.

[11] ***එහෙත් ඔවුන්*** *(ඉශ්‍රායෙලය)* ***<u>ජ්වලිතකරවන පිණිස ඔවුන්ගේ වැටීම</u> කරණකොටගෙන අන්‍යජාතීන්ට ගැළවීම පැමිණ තිබේ. අන්‍යජාතීන්ට ගැළවීම. පැස්සීමේ නිදර්ශනය***

[13] ***නුමුත් මම .... මාගේ මෙහෙයට ගෞරවකරමි.*** [14] ***කුමටද? යම් හෙයකින් <u>මාගේම මාංසය වූවන්ට ජ්වලිතය</u>*** *(ඉශ්‍රායෙලය)* ***<u>උපදවා,</u> ඔවුන්ගෙන් සමහරෙක් ගළවාගන්න පිණිසය.*** [15] ***මක්නිසාද ඔවුන්*** *(ඉශ්‍රායෙල්ගේ)* ***අත්හැරදැමීම ලෝකයා සමඟිකිරීම නම්, ඔවුන් පිළිගැනීම <u>මළවුන් කෙරෙන් ජීවනය</u>*** *(මුලු ලෝකය සඳහා ආශිර්වාදය)* ***මිස වෙන කුමක්ද? (රෝම 11:11-15)***

මෙම දින 21 ***ගෝලීය යෙසායා 62 නිරාහාරය*** , මෙම පැය තුළ ජාතීන් හරහා ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය තුළ ඉශ්‍රායෙලය පිළිබඳ බයිබලානුකූල සංවාදය වේගවත් කිරීමට උත්ප්‍රේරක වනු ඇතැයි අපි විශ්වාස කරමු. මෙම නිරාහාරය මැයි 28 වන දින, එනම් පෙන්තකොස්ත ඉරිදා අවසන් වේ. මෙම දිනයේදී, දෙවියන්වහන්සේගේ කැඳවීමට ප්‍රතිචාරයක් වශයෙන් ජේසන් හබාර්ඩ්, එරික් වොට් සහ ***"නගර 110"*** කණ්ඩායම, ඔවුන්ව බලමුලු ගැන්වීම සඳහා 2023 දී 4 වතාවක්, ඇදහිලිවන්තයන් මිලියන 100 ක් සමඟ ඉශ්‍රායෙලය වෙනුවෙන් එකට යාච්ඤා කරනු ඇත.

***<u>110 Cities.com</u>*** බලන්න - අප්‍රේල් 17වන දින, මෙම මිලියන 100 ක ඇදහිලිවන්තයන් මුළු මැද පෙරදිග සඳහාම යාච්ඤා කරනු ඇත.

මිලියනයකට වඩා වැඩි පිරිසක් ඉශ්‍රායෙලය සඳහා දෙවියන්වහන්සේගේ පොරොන්දු වෙනුවෙන් දින 21ක් පුරාවටම, දිනකට පැය 24ක් අඛණ්ඩව යාච්ඤා කිරීමට යන ***ඉතිහාසයේ පළමු අවස්ථාව*** මෙය වනු ඇත. මෙම යාච්ඤාවේ මුලපිරීමේ සුවිශේෂත්වය වන්නේ, ඉශ්‍රායෙලය සඳහා වූ උන්වහන්සේගේ අරමුණුවල එකට නියැලීම සඳහා *"මතු ඒමට නියමිත, මවනු ලැබූ පරම්පරාවක්"* සඳහා නියම කර ඇති දෙවියන්වහන්සේගේ කාලවල සටහන් කිරීමක් වන අතර, එය වේගවත් කිරීමකි (ගීතා. 102:13, 18).

[13] ***ඔබ නැගිට සියොන්ට*** *(යෙරුසලමට)* ***කරුණාකරනසේක. ඊට අනුකම්පාකළ <u>යුතු කාලය</u> දැන්ය, එසේය, <u>නියම කාලය</u> පැමිණ තිබේ.......***

[18] ***මෙය <u>මතු එන පරම්පරාව උදෙසා ලියනු ලබන්නේය.</u> <u>මවනු ලබන සෙනඟක්ද ස්වාමීන්ට ප්‍රශංසාකරන්නේය.</u> (ගීතාවලිය 102:13-18***

මෙම දින 21 නිරාහාරය ***"ගෝලීය එස්තර් මොහොතක්"*** වන අතර, (එස්තර් 4:14-16) යාච්ඤාවේ යෙදෙන මිලියන ගණනක් ඇදහිලිවන්තයන් එකතුව, යේසුස්වහන්සේගේ නැවත ඊම දක්වා යුදෙව් විරෝධය වැඩි වන විට ඉශ්‍රායෙලය සමඟ සිටින,

(සෙක. 14:1-5), ඉශ්‍රායෙලය සඳහා දෙවියන් වහන්සේගේ අරමුණු වෙනුවෙන් නිර්භීතව කතා කරන, (ශුද්ධ ලියවිල්ලේ ඇති පරිදි) අවසාන ගෝලීය එස්තර් මොහොතක් සඳහා සැලකිය යුතු මූලික ගෙවීමක් වනු ඇත. ඉශ්‍රායෙලය ඉතා වැදගත් ගැටුම් කිහිපයකට මුහුණ දෙන බැවින් මෙම නිරාහාරය අදටත් ඉතා වැදගත් වේ.

***14මක්නිසාද මේ ප්‍රස්තාවේදී නුඹ නිශ්ශබ්දවම සිටියොත්** (ප්‍රතිචාර නොදක්වා සිටියොත්) **වෙන තැනකින් යුදෙව්වරුන්ට නිදහසත් ගැළවීමත් පැමිණෙනවා ඇත......... නුඹ රාජ්‍යයට පැමුණුණේ මෙවැනි ප්‍රස්තාවක් නිසාම නොවේද කියා දන්නේ කවුද?***

***15එවිට එස්තර් මොර්දෙකයිට උත්තර යවමින්: 16ගොස් ෂූෂන්හි සිටින සියලු යුදෙව්වරුන් රැස්කරවා, මා උදෙසා ඔවුන් සමඟ දවස් තුනක් රෑ දාවල් නොකා නොබී නිරාහාරව සිටින්න. (එස්තර් 4:14-16)***

වසර 36ක් පුරා **[jhopfan.org]** *යෙරුසලමේ යාච්ඤා ගෘහයට* නායකත්වය දුන් ටොම් සහ කේට් හෙස්ට සහ වසර 20කට ආසන්න කාලයක් **[succathallel.com]** *ජෙරුසලමේ සුක්කාත් හලේල්ට* නායකත්වය දුන් *රික් සහ පැට්රීෂියා රයිඩිංග්ස්* වෙනුවෙන් ද, පසුගිය වසර 20+ පුරා පිහිටුවා ඇති අනෙකුත් යාච්ඤා සේවාවන් වෙනුවෙන්ද මම කෘතඥ වෙමි.

මෙම නිරාහාරයේදී අපි යේසුස් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය උසස් කරන අතර මහා ආඥාව ඉටු කිරීම සඳහා යෙරුසලමට දෙවියන්වහන්සේගේ ආශීර්වාදය සම්බන්ධ කිරීම කෙරෙහි අවධානය යොමු කරමු. "ශු. යොහන්ගේ 17:21-23 ගේ ආත්මය" සමගිය තුළ අපට තවත් බොහෝ දේ එකට කළ හැකිය.

ඉතිහාසයේ ප්‍රථම රෙපරමාදු දූත මණ්ඩල ව්‍යාපාරය සමඟ 24/7 යාච්ඤාව (අවුරුදු 100ක් පුරා පැවති) ඒකාබද්ධ කළ ***කවුන්ට් සින්සෙන්ඩෝර්ෆ්*** ගේ අපූරු කතාව පවසන, ජේසන් හබාර්ඩ්ගේ ***මොරාවියානු හාස්කම*** නම් ඩිජිටල් පොත නොමිලේ බාගන්න. **Isaiah62Fast.com** හි මෙම PDF පොත බලන්න හෝ YouTube හි ඔහුගේ කතාව බලන්න